ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2406/19 - 2024 ඔක්තෝබර් මස 16 වැනි බදාදා - 2024.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76අ වගන්තිය යටතේ නිවේදනය

2024.09.21 දින පැවති ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීමේදී ඡන්දදායකයාගේ වම් අතේ සුළැගිල්ල උචිත ලකුණින් සළකුණු කර ඇති බැවින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 53අ(3) වගන්තියෙන් ඡන්දදායකයා උචිත ලකුණින් සළකුණු කිරීම සම්බන්ධයෙන් මතුවිය හැකි ගැටළුව නිරාකරණය කිරීම සඳහා 2024.10.26 දින පැවැත්වීමට නියමිත ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමේ දී ඡන්දදායකයාගේ වම් අතෙහි මහපටඟිල්ල උචිත ලකුණින් සළකුණු කරනු ලැබේ.

ඡන්දදායකයාගේ වම් අතෙහි මහපටඟිල්ල නොමැති නම් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 53අ(3) අ, ආ (i) (ii) (iii) වගන්ති ප්‍රකාරව ඔහුගේ දකුණු අතෙහි වෙන යම් ඇඟිල්ලක් උචිත ලකුණින් සළකුණු කරන බව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76අ වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබී ඇති බලතල අනුව මෙයින් නිවේදනය කරමු.

ආර්. එම්. ඒ. එල්. රත්නායක,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එම්. ඒ. පී. සී. පෙරේරා,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

අමීර් ෆායිස්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

ඒ. ෂන්මුගනාදන්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 ඔක්තෝබර් මස 15 වැනි දින,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය,

EOG 10-0142

1A - G 42905 — 09 (2024/10)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*